227

# සමාජ සංචලතාව
# සහ
# නාගරික නිවාස යෝජනා ක්‍රම

## (රන්පොකුණගම නිවාස යෝජනා ක්‍රමය ඇසුරෙන්)

**කේ.ජී.පී.හෙට්ටිආරච්චි**

**විභාග අංකය : GEOG/R/159/98**

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
භූගෝල විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ පශ්චාත් උපාධිය සඳහා
ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධකාව

**භූගෝල විද්‍යා අධ්‍යනාංශය**
**කැලණීය විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව**

# සාරාංශය


ශ්‍රී ලංකාවේ නාගරික නිවාස යෝජනා ක්‍රම පිහිටුවීම සමාජ සංචලතාව කෙරෙහි බලපා ඇති ආකාරය, ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රත්පොකුණගම නිවාස යෝජනා ක්‍රමය ආශ්‍රිතව පර්යේෂණයට භාජනය කරන ලදි. මෙම පර්යේෂණයේදී නිවාස 1610 ත් සමන්විත නිවාස යෝජනා ක්‍රමයෙන් සසම්භාව්‍ය ක්‍රමයට තෝරාගනු ලැබූ 10% ක් වන නිවාස 161 ක් සමීක්ෂණය සඳහා යොදාගෙන ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය ආශ්‍රිතවත් සහභාගි නිරීක්ෂකයෙකු ලෙස ලද අත්දැකීම් අනුවත්, නිවාස යෝජනා ක්‍රමය තුළට සංක්‍රමණය වූ ජනතාවගේ සමාජ සංචලතා ක්‍රියාවලිය සඳහා පාදක වූ හේතු සාධක අධ්‍යයනය කළෙමි.

මෙම අධ්‍යයනයේදී නවීකරණය, නාගරීකරණය, ප්‍රදර්ශක ප්‍රතිවිපාකයන්ට හසුවීම, සන්නිවේදන ජාලයේ බලපෑම ආර්ථීක, සමාජීය සංස්කෘතික හා දේශපාලනික සාධකවල බලපෑම වැනි සමාජ සංචලතා කාරක රත්පොකුණගම නිවැසියන් කෙරෙහි බලපා ඇති බව හඳුනාගත හැකිවිය. අධ්‍යයනයට භාජනය කළ නිවැසියන් නිවාස යෝජනා ක්‍රමයට ඒමට පෙර හා නිවාස යෝජනා ක්‍රමයට ආපසු ඔවුන්ගේ සමාජ ස්ථරායනයේ වෙනස්වීම් වලට ලක්වීමේ වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබුණි. මේ අනුව නිවැසියන් නිවාස යෝජනා ක්‍රමය තුළට සංක්‍රමණය වීමේදී ඔවුන් සිටි සමාජ ස්ථරයට වඩා ඉහළ ස්ථරයකට ප්‍රවේශවීමක් පොදුවේ බොහෝදෙනා තුළ දක්නට ලැබුණි. එලෙස සමාජ සංචලතා ක්‍රියාවලිය සඳහා පාදකවන සාධක සියල්ලම හෝ කීපයක් අනුව නිවැසියන්ගේ සමාජ ජීවිතයේ ප්‍රගතියක් පෙන්නුම් කරන බව හඳුනාගත හැකිවිය.

ආර්ථීක, සමාජීක හා සංස්කෘතීය වශයෙන් වෙනස්වීම්වලට භාජනය වූ නිවැසියන්ගෙන් සමහරක් නාගරීකරණයවීමේදී නීත්‍යානුකූල නොවන ක්‍රියාමාර්ගීයන් වලට යොමුව ඇතිබව හෙළිවිය. ඒ හැරුණුවිට ජලය, විදුලි බලය, ප්‍රවාහනය, සහ පාරිභෝගික ගැටලු පවතින අතර වෙළඳපල පිළිබඳ ප්‍රශ්න පවතින බවද පැහැදිලි විය. අවසන් වශයෙන් මෙම අධ්‍යයනය සමස්ථ වශයෙන් ගෙන සමාජ සංචලතා ක්‍රියාවලියේදී සිදුවී ඇති යහපත් ප්‍රතිඵල ප්‍රශස්ත කරගැනීම සඳහාත් නිවැසියන් මුහුණදී ඇති ගැටලු විසඳාගැනීම සඳහාත් ක්‍රියාත්මක කළයුතු යෝජනාවන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම පර්යේෂණය මගින් ඉදිරිපත් කරනු ලබන කරුණු මේ සම්බන්ධයෙන් අනාගතයේ පර්යේෂණවල යෙදෙන්නන්ටද, ප්‍රතිපත්ති සම්පාදකයින්ටද තවදුරටත් ඒ පිළිබඳ කරුණු හදාරන්නන්ටද මූලාශ්‍රයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට හැකිවනු ඇත.